# සෝතාපන්නයාගේ අවබෝධය

## සෝතාපන්න සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, සංයුත්ත නිකාය 3 - පිටු අංක 346 - 347)

එකත් පසෙක සිටි රාධ තෙරණුවන්ට භාග්‍යවතුන් වහන්සේ මෙය වදාළ සේක.

රාධය, මේ උපාදාන ස්කන්ධ පසකි. එනම්;

1. රූප උපාදානස්කන්ධය
2. වේදනා උපාදානස්කන්ධය
3. සංඥා උපාදානස්කන්ධය
4. සංස්කාර උපාදානස්කන්ධය
5. විඥාන උපාදානස්කන්ධය

රාධය, යම් කලෙක ආර්ය ශ්‍රාවක තෙමේ මේ පංච උපාදානස්කන්ධයන්ගේ

- සමුදය (හටගැනීම),
- අත්ථඬ්ගමය (විනාශය),
- අස්සාද (ආස්වාදය),
- ආදීනව (දෝෂයත්),
- නිස්සරණය (නිදහස් වීමත්),

ඇති සැටියෙන් (යථා ස්වභාවයෙන්) දනියි නම්, මේ ආර්ය ශ්‍රාවකයා සෝවාන් යැයි ද, දුගතිගාමී නොවනසුලු යැයි ද, නියතයෙන් ම නිවනට යනසුලු යැයි ද කියනු ලැබෙයි.